කැලණිය අධ්‍යාපන කලාපය

මධ්‍ය වාර්ෂික පරීක්ෂණය - 2016

ඉතිහාසය - 1 පත්‍රය

11ශ්‍රේණිය කාලය:- පැය එකයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 – 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

1. සාහිත්‍ය මූලාශ්‍ර පිළිබඳව දැනට ලැබී ඇති තොරතුරු අනුව ලංකාවේ පැරණිම වංස කතාව කුමක් ද?
   i.මහාවංසය  ii. දීපවංසය  iii. බෝධිවංසය  iv. දාඨාවංසය
2. ලංකාවේ ඉතිහාසය ඉගෙන ගැනීම සඳහා ශිලා ලේඛන වැදගත් වන්නේ කුමන හේතුව නිසා ද?
   i. බෞද්ධාගමික තොරතුරු ලැබෙන නිසාය.
   ii. රජවරුන්ගේ දේශපාලන තොරතුරු ලැබෙන නිසාය.
   iii. සමකාලීන වෙනත් මූලාශ්‍ර වලින් ද සනාථ වන නිසාය.
   iv. දීර්ඝ කාලයක් නොනැසී පවතින නිසාය.
3. ශ්‍රී ලංකාව ජනාවාසයක්බවට පත් කරන ලද ආදිතමයා වූ හෝමෝසාපියන් මානවයාගේ ප්‍රධානම යැපීම් මාර්ගය වූයේ ,
   i.මී වද කැඩීම හා ධාන්‍ය වගාවය
   ii.සතුන් දඩයම් කිරීම හා වෙළඳාමය.
   iii. ධාන්‍ය වගා කිරීම හා වෙළඳාමේ නිරත වීමය.
   iv.සතුන් දඩයම් කිරීම හා තැන තැන යමින් ආහාර ද්‍රව්‍ය රැස් කිරීමය.
4. මුල්ඓතිහාසික යුගයේ ජනාවාස බිහිවීමට බලපෑ ප්‍රධාන සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
   i.වාර්ෂික වර්ෂාපතනය හා පසේ ස්වභාවය  ii. දඩයම් කිරීමට හා සතුන් වෙළඳාමට හැකිවීම
   iii.විශාල වනාන්තර සහිත ප්‍රදේශ වීම  iv.කඳු බෑවුම් සහිත ප්‍රදේශ වීම
5. පූර්ව රාජ්‍ය සමයෙහි පරුමක වරයෙකු බිහිවීමට අවශ්‍යතාව ඇති වූයේ කුමන හේතුව නිසා ද?
   i.වැව් පද්ධතියට අදාළ කටයුතු කිරීමටය.  ii:ගම්වැසියන් ආරක්ෂා කිරීමටය.
   iii.ගමේ වැව නඩත්තු කිරීමටය.  iv.ගමේ වැවෙන් බදු එකතු කිරීමටය.
6. ප්‍රාදේශීය රජවරුන්'පොවනි රජ'වශයෙන් හැඳින්වූ බවට උදාහරණ දිය හැකි සෙල්ලිපිය කුමක් ද?
   i.සංගමු විහාර සෙල්ලිපිය  ii. ඇඹුල්අඹේ ප්‍රදේශයේ සෙල්ලිපිය
   iii.කොත්ගල් කන්ද සෙල්ලිපිය  iv.යටහලෙන සෙල්ලිපිය
7. අතීතයේ පැවති රාජ්‍ය උරුමයට වඩා වෙනස් වූ ක්‍රමයකට රාජ්‍යත්වයට පත්වෙමින් නව රාජවංශයක් ආරම්භ කළ රජතුමා කවුරුන් ද?
   i.උත්තිය රජු  ii.දුටුගැමුණු රජු  iii. මුගලන් රජු  iv.වසභ රජු
8. පැරණි රාජ්‍ය තන්ත්‍රය තුළ සිටි නිලධාරීන් අතුරෙන් ලේඛනාගාර ප්‍රධානීන් හඳුන්වා ඇත්තේ ,
   i.කොතුරුගැ නා  ii. ශෙනපති  iii.කනපෙඩික  iv. බතගු

9. `දසගම් ඇත්තෝ `වශයෙන් සෙල්ලිපි වල හඳුන්වා ඇත්තේ,

i. භික්ෂූන්ට ගල් ගුහා පූජා කළ පිරිසය. ii.ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන මණ්ඩලය

iii. භික්ෂූන්ට දානය ලබා දුන් පිරිසය. iv.වැව් ආරක්ෂා කළ පිරිසය.

10. කාලිංග හා පාණ්ඩ්‍ය දේශයන් සමඟ විවාහ සබඳතා පවත්වා ගත් රජ කෙනෙකු වශයෙන් වැදගත් වන්නේ කුමන රජු ද?

i.පළමුවන විජයබාහු රජු ii. පළමුවන පරාක්‍රමබාහු රජු

iii. නිශ්ශංකමල්ල රජු iv.පළමුවන ගජබාහු රජු

11. අතීතයේ පැවති සත්ව පාලන කටයුතු පිළිබඳ තොරතුරු සපයමින් කිරි දෝවනය කරන කාන්තාවකගේ කැටයමක් දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයක ද?

i.හම්බන්තොට වෙහෙරකෙම ප්‍රදේශයේ විහාරයක

ii.වේගිරිය දේවාලයේ

iii. මැදිරිගිරිය ඇත්වෙහෙරේ

iv.සීගිරිය නාගපබ්බත විහාරයේ

12. නානා දේශී වෙළඳ සංවිධානයට අයත් ලෝහ මුද්‍රාවක් හමු වීඇති ප්‍රදේශය කුමකු ද?

i. යටිගල්පොත්ත ii. මුතුගල්ල iii. රංචා මඩම iv. හම්බන්තොට

13. විදේශීය භික්ෂුවක වූ බුද්ධඝෝෂ හිමියන් අධ්‍යාපන කටයුතුවල නිරත වී ඇත්තේ,

i.අභයගිරි විහාරයේ ය. ii. මහා විහාරයේ ය.

iii. ජේතවන විහාරයේ ය. iv.මරුගන පිරිවෙනේ ය.

14.

- විවිධ රටවලින් මෙරටට වෙළෙන්දන් පැමිණීම
- රාජ සභාවේ දෙමළ අධිකාරි නම් තනතුරක් තිබීම.
- අගම්පඩි හමුදාව ලාංකික පාලකයින්ට සහාය දීම.

ඉහත තොරතුරු සියල්ලම ගත්කළ එළඹිය හැකි නිගමනය වන්නේ,

i. රටතුළ විවිධ ජාතීන් සිටි බවය.

ii. විවිධ ජාතීන් වෙළදාම කළ බව ය.

iii. රටතුළ වාර්ගික සහජීවනය පැවති බව ය.

iv. පඩි ගෙවන හමුදාවක් සිටි බව ය.

15. මානව ගමන් මගේ දී ලද තාක්ෂණික ජයග්‍රහයන් කිහිපයක් පහත දැක්වේ. ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව සකස් කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.

A - සකපෝරුව යොදාගෙන මැටි භාණ්ඩ සෑදීම.

B - මැටි ඔරු සුසාන සකස් කිරීම

C - බිම් වීදුරු පාෂාණ මඟින් මෙවලම් සාදා ගැනීම

D - පීඩනයක් ඇතිකර ජලය ඉහළට ඔසවා ජලමල් ක්‍රියාත්මක කරවීම

i.BCAD ii.CBAD iii. CBDA iv. ACDB

16. අතීතයේ යකඩ නිස්සාරණය සිදුකළ බවට තොරතුරු සපයන ප්‍රදේශ තෝරන්න.

i. බලංගොඩ සමනල වැව හා සීගිරිය අලකොල වැව

ii. අම්පාර රජගල හා අනුරාධපුර දුනුමඩලාකන්ද

iii.සීගිරිය හා වෙස්සගිරිය

iv.පතිරාජවෙල හා රංචා මඩම

17. වැව් බැම්ම සකස් කිරීමේ තාක්ෂණයේ ස්වභාවය හඳුනා ගැනීමට කැණීම් කරන ලද වැවක් සඳහන් පිළිතුර තෝරන්න.

i.කවුඩුලු වැව ii. අනුරාධපුරයේ නුවර වැව

iii.සීගිරියේ මහ වැව iv. ගිරිතලේ වැව.

18. දැදිගම ඇත්පහන තුළින් හෙළිවන විද්‍යාත්මක මූලධර්මය වන්නේ ,

i. දහනය සඳහා ඔක්සිජන් අවශ්‍ය බවයි.

ii.පීඩනයක් ඇති කොට ඉහළට එසවීමේ මූලධර්මයයි.

iii.ස්ථිතික ජලවිද්‍යා මූලධර්මයයි.

iv.ලම්භාකාර බව තුළින් පොළවට ඇති කරවන පීඩනය නිෂ්ක්‍රීය වන බවයි.

19. 'අ' තීරුවෙහි වැවක අංග හා 'ආ' තීරුවෙහි ඒවායින් සිදුවන ක්‍රියාවලිය දැක්වේ. තීරු දෙක නිවැරදිව

ගැලපූ විටලැබෙන පිළිතුර කුමක් ද?

| අ | ආ |
|---|---|
| 1. සොරොව්ව | A - වැව් බැම්ම රළපහරින් සේදීයාම වැළැක්වීම |
| 2. රළපනාව | B - වැවේ අතිරික්ත ජලය පිටකිරීම |
| 3. බිසෝකොටුව | C - සොරොව්වේ ජලය පාලනය කිරීම |
| 4. මොහොල | D - ඇළ මාර්ග වලට ජලය මුදාහැරීම |
| | E - ජලය මුදා හැරීමේ දී සොරොව්වට වන පීඩනය අවම කිරීම |

i. BAEC ii. DCBA iii. BCDE iv. DAEC

20. මහාධිකරණයක් පිළිබඳ සඳහන් වන සිතුල්පව්වේ සෙල්ලිපිය කරවන ලද්දේ කුමන රජතුමා ද?

i. පළමුවන ගජබාහු රජු ii.පළමුවන බුවනෙකබාහු රජු

iii.පළමුවන වීරබාහු රජු iv.පළමුවන විජයබාහු රජු

21.වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල සිහිනැටි මීස මුං වැපිරීම තහනම් කිරීමෙන් පෙනී යන්නේ,

i. පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි .

ii. කෘෂිකාර්මික ප්‍රතිපත්ති මැනවින් පවත්වා ගෙන යාමයි.

iii.මුං ආහාරයට නුසුදුසු වීමයි.

iv.සිහිනැටි වීපමණක්ම වැපිරිය යුතු වීමයි.

22. සමාජ ස්ථරායනය හේතු කොටගෙන සිදු වූ ක්‍රියාවලියක් ලෙස වැදගත් වන්නේ,

i. ධනවත් සමාජයක් ඇතිවීමයි. ii. දුප්පත් සමාජයක් ඇතිවීමයි.

iii.නගර බිහිවීම සිදු වීමයි. iv.වෙළඳාම දියුණු වීමයි.

23. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නම් උපාධි නාමයෙන් පිදුම් ලැබූ රජතුමා වන්නේ,

i. පළමුවන පරාක්‍රමබාහු රජු ii. දෙවන පරාක්‍රමබාහු රජු

iii.තුන්වන පරාක්‍රමබාහු රජු iv. හතරවන පරාක්‍රමබාහු රජු

24. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ ප්‍රධානම හේතුව කුමක් ද?

i. දේශ ගවේෂණ ව්‍යාපාර ආරම්භ වීමයි.

ii. යුරෝපයේ විශ්ව විද්‍යාල බිහි වීමයි.

iii.කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන්ට යටත් වීමයි.

iv.ලෝකය පුරා වෙළඳාම දියුණු වීමයි.

25. වර්ෂ 1638 සිදු වූ ගන්නෝරුව සටනට නායකත්වය දුන් පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා වූයේ,

i. කොන්ස්තන්තීනු ද සා ය. ii. අපොන්සු ද ඔලිවේරා ය.

iii. පෙරෙයිරා ද ලසර්දා ය. iv. දියෝගු ද මෙලෝ ය.

26. පහත 'අ' තීරුව හා 'ආ'තීරුව නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1.හම්ප්‍රි ඩේවි | A - මෝටර් රථය |
| 2.ඩෙම්ලර් | B - නූල් කටින යන්ත්‍රය |
| 3. රිචඩ් ආක්රයිඩ් | C - වානේඋඳුන |
| 4. හෙන්රි බෙස්මර් | D - ජෙනී යන්ත්‍රය |
| | E - ආරක්ෂක ලාම්පුව |

i. DABC ii. EACB iii. BAEC iv. EABC

27. කාර්මික විප්ලවයේ බලපෑම ලංකාවට ද ඇති කරමින් කොළඹ මහනුවර මාර්ගය ඉදිකරන ලද්දේ කුමන ආණ්ඩුකාරවරයා ද?

i.තෝමස් මේට්ලන්ඩ් ii. විලියම් ග්‍රෙගරි

iii.එඩ්වඩ් බාන්ස් iv. හර්කියුලිස් රොබින්සන්

28.කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මඟින් ඉදිරිපත් වූ ඉඩම් ප්‍රතිපත්තිය නිසා ඇති වූ ප්‍රතිඵලයක් නොවන පිළිතුර තෝරන්න.

i. සාමාන්‍ය ජනතාවට වගා නොකළ ඉඩම් අහිමි වීම

ii. වගා නොකළ ඉඩම් වගා කිරීමට ආධාර දීම.

iii. වගා නොකළ ඉඩම් රාජසන්තක වීම.

iv. සාමාන්‍ය ජනතාව පීඩාකාරී තත්වයකට පත් කිරීම.

29. ඉංග්‍රීසි වෙළඳ සමාගම යටතේ ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පාලනය කිරීමේ දී දක්නට ලැබුණබ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ මින් කුමක් ද?

i. මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීමට ගිය වියදම් පියවා ගැනීමට කටයුතු කිරීමයි.

ii. මුහුදුබඩ ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා නීති රීති ගෙන ඒමයි.

iii. උඩරට තම ප්‍රදේශයට නතු කර ගැනීමට කටයුතු කිරීමයි.

iv. එලදාවේ ප්‍රමාණය නොසලකා බදු අය කිරීමයි.

30.

- කරතොට ධර්මාරාම හිමිගෙන් සිංහල ඉගෙනීම
- දේශීය සිරිත් විරිත් පිළිබඳ මනා දැනුමක් තිබීම.
- රදල ප්‍රධානීන්ගේ ප්‍රසාදය දිනා ගැනීම.
- තීක්ෂණ බුද්ධියෙන් යුතුව තම රාජකාරිය සාර්ථකව නිම කිරීම

ඉහත තොරතුරු වලින් හැඳින්වෙන පුද්ගලයා කවුරුන් ද?

i. මැක්ඩෝවල් සෙනෙවියා ii. ජෝන් ඩොයිලි

iii.බාබට් සෙනෙවියා iv.ෆෙඩ්රික් නෝර්ත්

31.බ්‍රිතාන්‍ය පාලන කාලයේ අය කළ ඇඟ බද්දෙන් නිදහස් වීමට නම් ,

i.තේවතු වල නොමිලේ වැඩ කළ යුතු විය.

ii.ඉංග්‍රීසීන්ගේ යුධ හමුදාවට බැඳිය යුතුය.

iii.වසරකට දින 21ක් මාර්ග තැනීමේ වැඩ කළයුතු ය.

iv.වසරකට දින 6 ක් නොමිලේ පාරවල් තැනීමේ නිරත විය යුතු ය.

32.පහත දක්වා ඇති තොරතුරු වලට අදාළ පුද්ගලයින් අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

- වෙසක් පොහොය දින නිවාඩු දිනයක් බවට පත් කිරීම.
- බුද්ධගයාව රැක ගැනීමට කටයුතු කිරීම
- අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැක ගැනීමේ ව්‍යාපාරයක් අරම්භ කිරීම.
- මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව නාට්‍ය මඟින් පෙන්වීමට කටයුතු කිරීම.

i. ධර්මපාලතුමා, ඕල්කට් තුමා,ජෝන් ද සිල්වා මහතා, වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා

ii. මිගෙට්ටුවත්තේ හිමි , ධර්මපාලතුමා, ජෝන් ද සිල්වා මහතා, ඕල්කට් තුමා

iii. ඕල්කට් තුමා, ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ,ජෝන් ද සිල්වා මහතා

iv. ඕල්කට් තුමා, ජේම්ස් පීරිස් මහතා, ධර්මපාලතුමා, ජෝන් ද සිල්වා මහතා

33. A - ප්‍රථමවරට ඡන්ද බලය භාවිතා කර ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයින් තෝරා ගැනීම.
B - නිල නොලත් පිරිස ව්‍යවස්ථාදායකයේ බහුතරය වීම
C - රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කිරීම.
D - පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම.
E - රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇති කිරීම.
ඉහත තොරතුරු වලින් ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට අයත් යෝජනා දැක්වෙන පිළිතුර තෝරන්න

i. A සහ B ii. D සහ E iii. C සහ D iv. C සහ E

34 ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යපාරය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින් ද?

i. එෆ්. ආර්. සේනානායක මහතා ii. ඩඩ්ලි සේනානායක මහතා
iii. එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායක මහතා iv. ඩී.එස්. සේනානායක මහතා

35. වර්ෂ 1919 පිහිට වූ ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති වරයා වූයේ,

i. පොන්නම්බලම් අරුණාචලම් මහතා ය.
ii. පොන්නම්බලම් රාමනාදන් මහතා ය.
iii. ජේම්ස් පීරිස් මහතා ය.
iv. ආරුමුගම් නාවලර් මහතා ය.

36. නටේස අයියර් නායකත්වය සපයන ලද්දේ,

i. රෙදිමෝල් කම්කරුවන්ගේ වෘත්තීය සංගමයට ය.
ii වතු කම්කරුවන්ගේ වෘත්තීය සංගමයට ය.
iii. වරාය කම්කරුවන්ගේ වෘත්තීය සංගමයට ය.
iv. කරත්ත කරුවන්ගේ වෘත්තීය සංගමයට ය.

37. බ්‍රිතාන්‍ය පාලනයේ අහිතකර බලපෑමක් වන්නේ මින් කුමක් ද?

i. ඉංග්‍රීසි කතා කරන පංතියක් බිහිවීම. ii. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ලැබීම
iii. ගම් සභාව අහෝසි වීම. iv. වැවිලි බෝග වගාව හඳුන්වා දීම.

38. 1948 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් නිදහස ලබාගත් නමුත් 1972 දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායිකාව වූයේ,

i. මොලමුරේ ආර්යාවයි. ii. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියයි
iii. විවියන් ගුණවර්ධන මැතිණියයි. iv. බ්‍රිතාන්‍ය මහ රැජිණයි.

39. එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායක මහතාගේ පාලන කාලයට සම්බන්ධ සිදුවීමක් නොවන පිළිතුර කුමක් ද?

i. රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වීම. ii. ශ්‍රී ලංකාව ජනරජයක් වීම
iii. වරාය සහ බස් ජන සතු කිරීම. iv. ආරක්ෂක හා බාහිර කටයුතු ගිවිසුම් අහෝසි කිරීම

40. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයට අයත් ජලාශයක් නොවන පිළිතුර කුමක් ද?

i. කොත්මලේ ජලාශය ii. රන්දෙනිගල ජලාශය
iii. ඉඟිනිමිටිය ජලාශය iv. වික්ටෝරියා ජලාශය

කැලණිය අධ්‍යාපන කලාපය

මධ්‍ය වාර්ෂික පරීක්ෂණය - 2016

ඉතිහාසය - 11 පත්‍රය

11ශ්‍රේණිය කාලය:- පැය තුනයි

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- ii කොටසින් ප්‍රශ්න හතරකට ද iii. කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

i කොටස

1. (1).(අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේද ලකුණු කොට නම් කරන්න.

i. කලාඕය , පොළොන්නරුව, දේවනගර, දඹකොළපටුන, මහනුවර, හුරුලු වැව, මාතලේ, දඹදෙණිය, රංවාමඩම, බුන්දල, ත්‍රිකුණාමලය, හල්දුම්මුල්ල. (ලකුණු 12)

ii. ඉතාලිය,ඕලන්දය, එංගලන්තය, පෘතුගාලය, ජපානය, අරාබිය. (ලකුණු 06)

(ආ) i). පහත A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු ආශ්‍රිත ප්‍රශ්නවලට කෙටි පිළිතුර සපයන්න.

A - හම්බන්තොටින් සොයාගත් ලෝහ මුද්‍රාව අයත් වෙළඳ සංවිධානය කුමක් ද?

B - දළදා වහන්සේ රැගෙන හේමමාලා හා දන්ත කුමරු මෙරටට ගොඩබැසි වරාය නම් කරන්න.

C - දඹදෙණි රාජධානියේ ආරම්භක රජතුමා කවිරුන් ද?

D - ඩිවිනා කොමිඩියා කාව්‍ය ග්‍රන්ථය රචනා කරන ලද කතුවරයා කව්රුන් ද? (ලකුණු 04)

- A හා B යටතේ දක්වා ඇති පිංතූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න

ii). 1. A පින්තූරයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?

2.එය හමුවී ඇත්තේ කුමන ප්‍රදේශයකින් ද?

3.එය අයත්වන ඓතිහාසික යුගය කුමක් ද?

4.මෙම නිර්මාණය යොදා ගත්තේ කුමන කාර්යයට ද? (ලකුණු 04)



A

B

iii. 1 B පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?

2.මෙම පුද්ගලයා කරන ලද විශිෂ්ට නිර්මාණය කුමක් ද?

3.එය නිපද වූ වර්ෂය සඳහන් කරන්න.

4. මෙම නිර්මාණය ක්‍රියා කිරීම සිදු වන්නේ කුමන බලයක් යොදාගෙන ද? (ලකුණු 04)



B

ii කොටස

(2).i).දුටුගැමුණු රජුගේ සෙන්පතියන් වීමට පෙර පරුමකවරුන් වශයෙන් කටයුතු කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

ii). ගමික විසින් තම වැසියන් වෙනුවෙන් ඉටුකළ යුතු කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ල 04)

iii).පණ්ඩුකාභය රජුගේ සේවාව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv). පැරණි සමාජය තුළ ජීවත් වූ ජනතාව ජීවනෝපාය වශයෙන් විවිධ කර්මාන්ත වල නිරත වූ බව කරුණු තුනක් ඇසුරෙන් පහැදිලි කරන්න. (ලකුණු 06)

(3). i).අඹන් ගඟේ ජලය ලබා ගෙන පෝෂණය වන වැව් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii). පැරණි වාස්තු විද්‍යාඥයින්ගේ කුසලතාවයන් විදහා දක්වන පහත සඳහන් නිර්මාණවලට උදාහරණ එක බැගින් ලියන්න.

A - පිළිමගෙය

B - රජමාළිගය

C - පොකුණ

D - රෝහල (ලකුණු 04)

iii).විද්‍යාත්මක අදහස් විවිධ ස්වරූපයෙන් පූර්ව ඓතිහාසික යුගයේ දී ද භාවිතාකර ඇති බව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv).මහවැව් නිර්මාණය තුළින් හෙළිවන විද්‍යාත්මක හා තාක්ෂණික විශිෂ්ඨත්වය කරුණු තුනක් ඇසුරෙන් පහැදිලි කරන්න. (ලකුණු 06)

(4). i).දෙවන නාගරීකරණ ක්‍රියාවලිය යටතේ බිහි වූ නගර තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii). පොළොන්නරුව රජධානිය බිඳ වැටීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii).රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු නිරිත දිග රාජධානි ප්‍රදේශවල ආර්ථික කටයුතු සිදු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv). කෝට්ටේ රාජධානියේ හයවන පරාක්‍රමබාහු රජුගෙන් ඉටු වූ සේවාව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(5). i).මහනුවර රජධානිය පාලනය කළ නායක්කාර් වංශික රජවරු තිදෙනෙක් නම් කරන්න (ල. 03)

ii).පහත සඳහන් A B C D යටතේ අසා ඇති තොරතුරු සපයන්න.

A - ක්‍රි. ව. 1630 දී දෙවන රාජසිංහ රජු හා පෘතුගීසීන් අතර ඇති වූ සටන

B - ඉංග්‍රීසීන් විසින් ශ්‍රී වික්‍රමරාජසිංහ රජු පිටුවහල් කළ ප්‍රදේශය

C - ක්‍රි. ව. 1753 සියම් දේශයෙන් උපසම්පදාව ගෙන්වීමට කටයුතු කළ රජතුමා

D - ඉංග්‍රීසීන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගන්නා විට උඩරට සිටි රජතුමා (ලකුණු 04)

iii).පළමුවන විමලධර්මසූරිය රජු තම නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ගන්නා ලද පියවර දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv).උඩරට රාජධානියේ පරිපාලන කටයුතු සිදු වූ අංශ හතර නම් කොට ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 06)

(6). i). පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට මෙරට පැවති රාජ්‍ය තුන නම් කරන්න. (ලකුණු 03)

ii). පහත A B C D යටතේ අසා ඇති තොරතුරු සපයන්න.

A - මායාදුන්නේට නාවික සහාය ලබා දුන් කැලිකට්හි පාලකයා -

B - සමුද්‍රදේවි කුමරිය විවාහ කර ගත් සෙනෙවියා

C - ක්‍රි. ව. 1602 ලංකාවට පැමිණි ප්‍රථම ලංදේසි ජාතිකයා - (ලකුණු 04)

D -ක්‍රි. ව. 1561 දී සංකිලි රජු බලයෙන් පහකොට යාපනයේ බලය අල්ලා ගත් කුමාරයා-

iii). සීතාවක රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv). පෘතුගීසීන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට නොහැකි වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(7). i). පහත සඳහන් විස්තරවලට අදාළ පුද්ගලයින් නම් කරන්න.

A - ක්‍රි.ව. 1797 මුහුදුබඩ ප්‍රදේශවල සිදු වූ කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පත්කළ කොමිසමේ සභාපති වරයා

B - ජෝන් ඩොයිලි සමඟ තරගෙට කවි ලියූ සිංහල කාන්තාව-

C - ක්‍රි. ව. 1815 දී බ්‍රිතාන්‍ය ධජය බිම හෙළා ශ්‍රී ලාංකික කොඩිය එස වූ භික්ෂූන් වහන්සේ (ලකුණු 03)

ii). කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii). මිෂනාරී සංවිධානවලට එරෙහිව බෞද්ධ පුනරුදයක් ඇති කිරීම වෙනුවෙන් දේශියයන් කටයුතු කළ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv). නිදහස ලැබීමෙන් පසු කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii කොටස

(8). i).පහත A B C යටතේ දක්වා ඇති නිර්මාණ බිහිකළ පුද්ගලයින්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A.මොනාලිසා චිත්‍රය B. පියෙටා ප්‍රතිමාව C. දුරදක්නය (ලකුණු 03)

ii). යුරෝපීයයන්ට නව මුහුදු මාර්ග සොයා ගැනීමේ කාර්යය සාර්ථක කර ගැනීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii). වෛද්‍ය විද්‍යාවේ නවෝදයක් පුනරුද සමයේ ඇති වූ බව උදාහරණ සපයමින් විස්තර කරන්න. (ලකුණු 05)

iv). පුනරුද සමයේ සිදු වූ ආර්ථික වෙනස්කම් කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(9). i). කාර්මික විප්ලවයේ බලපෑමට ලක් වූ ප්‍රධාන කර්මාන්ත තුන නම් කරන්න. (ලකුණු 03)

ii). බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ඇතිවීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii). කාර්මික විප්ලවයේ බලපෑම ශ්‍රී ලංකාවට ලැබුණු ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv). සමාජ ක්ෂේත්‍රය වෙනස් කිරීමටද කාර්මික විප්ලවයේ බලපෑම සිදු වූ බව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

